පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 95

ආයතනයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 95

நிறுவனத்தின் பெயர்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களினிற்குப் பெறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடாபாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 95

Name of the institution: Ministry of Agriculture, Livestock, Lands and Irrigation

Submission of observations of the Hon. Minister in charge of the institutions and Steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : අංක 95

ආයතනයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ඵලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ අදායම එකතු කිරීම, වැඩි දියුණු කිරීම සඳහා පාර්ශ්වකරුවන් විසින් සහ පාර්ශ්වකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ මූලික තාක්ෂණික කමිටුවේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ රැස්වීම **විමර්ශනය කරන ලද දිනය - 2023 මැයි 23**	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	**කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය**
06. <u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණය හරහා රජයේ අදායම වර්ධනය කර ගැනීමට අදාළ සැලසුම්</u>	
• ජාතික ශාක නිරෝධායන සේවාව (National Plant Quarantine Service) සඳහා, ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයේ (International Trade Center) ප්‍රාග්ධනය හා තාක්ෂණික සහය ඇතිව මාර්ගගත ගෙවීම් ක්‍රමයක් නිර්මාණය කිරීම ආරම්භ කර ඇති බව.	මෙය 2024.01.01 දින සිට ක්‍රියාත්මක කර ඇත.
• ඒ සඳහා මහජන බැංකුව සමග ගිවිසුම් වීමට නියමිත බවත්, 2023 අගෝස්තු ව්‍යාපෘතිය නිම කිරීමට නියමිත බවත් ප්‍රකාශ විය.	මහජන බැංකුව සමග ගිවිසුම් ගත වී ගාස්තු අයකර ගැනීම E-Payment System හරහා සිදු කරනු ලැබේ.
• එමගින් රු.මි. 18 සිට රු.මි. 100 දක්වා ආදායමේ වර්ධනය වීමක් අපේක්ෂිත බව.	E-Payment System මගින් අදායම වැඩි නොවන අතර ගාස්තු ඉහළ දැමීමෙන් සහ නව ගාස්තු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අනුව ලබා ගත යුතු අදායමකි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

• KOICA ආධාර යටතේ 2019 දී ආරම්භ වී ඇති, ශාක නිරෝධායන තොරතුරු කළමනාකරණ පද්ධතිය (Plant Quarantine Information Management System (PQIMS) මගින් ආනයන බලපත්‍ර නිකුත් කිරීම ඇතුළු සියලු කාර්යයන් ස්වයංක්‍රියව සිදු වන බව. • 2023 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය අවසන් වීමට නියමිත බව	ශාක නිරෝධායන තොරතුරු කළමනාකරණ පද්ධතිය (Plant Quarantine Information Management System (PQIMS) අවසන් අදියරට පැමිණ ඇත. I. අවසන් පරීක්ෂණ වාර්තාව KOICA වෙත ලබා දී ඇත. එම ආයතනය මෙම වාර්තාවට අනුව අවශ්‍ය කටයුතු කරමින් පවතී. II. Final Version Release වීමෙන් පසු Hosting Server එකක් මිල දීගෙන ශාක නිරෝධායන තොරතුරු කළමනාකරණ පද්ධතිය (PQIMS) ස්ථාපිත කළ යුතුය.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(2019, 2020 හා 2021 විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය)

විමර්ශනය කරන ලද දිනය - 2023 ජූලි 06

කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
01. <u>ආනයනික ගව ශුක්‍ර පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව තුල නොතිබීම</u> රටේ වාර්ෂික අවශ්‍යතාවයට වඩා 34% ක පමණ ගව ශුක්‍ර අධි නිෂ්පාදනයක් දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීම පිළිබඳව කාරක සභාව විමසා සිටියේය හදිසි අවශ්‍යතාවයන්හි දී ප්‍රයෝජනයට ගැනීම සඳහා එසේ අධි නිෂ්පාදනයක් සිදුකරන බවත් අතිරික්ත ප්‍රමාණය දියර නයිට්‍රජන් තුළ ගබඩා කර තිබෙන හෙයින් ඒවා වසර 20 කට වඩා වැඩි කාලයක් තබා ගත හැකි බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා (ප්‍ර.ග.නි./ග.නි.) ප්‍රකාශ කළේය. මෙහිදී පෞද්ගලික අංශයෙන් ආනයනය කරන ගව ශුක්‍ර ප්‍රමාණය, ප්‍රමිතිය හා සාර්ථකභාවය පිළිබඳ සංඛ්‍යාලේඛන/ පසුවිපරමක් දෙපාර්තමේන්තුව තුළ නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.	*ආයනයනික ගව ශුක්‍ර* ආයනයනික ගව ශුක්‍ර පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබයි. එනම් අනයනය කරන ලද ශුක්‍ර වඩි අයත් සතුන්ගේ විස්තර, ශුක්‍ර වර්ගය, අප රට තුළ භාවිතයේදී ලබා දෙන කේතය, එම ශුක්‍ර වර්ගය නිකුත් කරනු ලබන ආයතනය ආදී තොරතුරු සහිත තොරතුරු පද්ධතියක් ඉදිරි කටයුතු වෙනුවෙන් නඩත්තු කරගෙන යනු ලබයි. එසේම එම ආනයනික ගව ශුක්‍ර බෙදා දුන් පශු වෛද්‍ය කාර්යාල හා එය භාවිතයෙන් ලබන ප්‍රගතිය පිළිබඳ පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් තොරතුරු රැස් කරමින් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා තොරතුරු පද්ධතියක් නඩත්තු කරමින් පවතී. ***පුද්ගලික අංශය මඟින් ආනයනය කරන ගව ශුක්‍ර පිළිබඳ තොරතුරු*** දෙපාර්තමේන්තුව නියාමනය යටතේ පුද්ගලික අංශය මඟින් ආනයනය කරන ගවශුක්‍ර වඩි කුණඩසාලේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානයේදී එහි ගුණාත්මක බව පරීක්ෂා කර, නියමිත ප්‍රමිතීන්ට අනුකූල වන ගව, එළු ශුක්‍ර පමණක් කෘත්‍රිම සිංචන කටයුතු සඳහා නිර්දේශ කරනු ලබයි. ඒ අනුව පුද්ගලික අංශය සතු ආනයනික ගව ශුක්‍ර පිළිබඳ තොරතුරු 2018 සිට දෙපාර්තමේන්තුව විසින් දත්ත පද්ධතියක් නඩත්තු කර ගෙන යනු ලබයි. පුද්ගලික අංශය විසින් ආනයනය කරන ලද ශුක්‍ර වර්ගය හා ඊට අදාළ තොරතුරු, සත්ත්ව වර්ගය, මෙරටදී

ඩබ්.ඒ.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

<u>නිර්දේශ / නියෝග</u> රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් ආනයනය කරන ගව ශුක්‍ර ප්‍රමාණය, ප්‍රමිතිය, තොග පවත්වා ගැනීම, එය ජාතික සංඛ්‍යාලේඛන වලට එකතු කිරීමේ වැඩපිළිවෙලක් හා ඒවායේ සාර්ථකභාවය පිළිබඳව පසුවිපරමක් සිදුකිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ වාර්තාවක් 2023 අගෝස්තු 07 දින වනවිට කාරක සභාවට යොමුකරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	ඒවාහි භාවිතය හා ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දක්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. ඩී.පී. වික්‍රමසිංහ ලේඛකම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 80/5, "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

02. <u>දෙපාර්තමේන්තුව සතු ජාතික දත්තවල නිරවද්‍යතාවය පිළිබඳ ගැටළු පැවතීම</u>

දෙපාර්තමේන්තුව සතු ජාතික දත්තවල නිරවද්‍යභාවය පිළිබඳව ගැටළු පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව ගව ශුක්‍ර වඩි මිලියන 1.3 නිෂ්පාදනය කර ඉන් මිලියන 1 ක ප්‍රමාණයක් කෘතිම සිංචනයන් සිදුකර තිබෙන නමුත් පැටවුන් 316,000 ක් පමණ අඩු සංඛ්‍යාවක් බිහිවී තිබීම පිළිබඳව ප්‍රශ්න කළේය.

<u>නිර්දේශ / නියෝග</u>

රටතුළ සිදුකරන කෘතිම සිංචන සාර්ථක වීමේ ප්‍රතිශතය 30% ප්‍රමාණයක පවතින බවත්, එය 40% මට්ටම දක්වා වර්ධනය කිරීමට උත්සහ ගන්නා, ගෝලීය මට්ටමේදී මෙම අගය 50% ක් පමණ වන බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි.ප්‍රකාශ කළේය.

1. නිෂ්පාදන දත්ත

සැළසුම් හා ආර්ථික අංශය මඟින් ගොවිපල දත්ත ලබා ගැනීමට ගොවිපල ලියාපදිංචි දත්ත සටහනක් පවත්වා ගෙන යනු ලැබේ.

2. අභිජනන දත්ත

සෑම මසකම සියලු පළාත් සත්ත්ව නිෂ්පාදන සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරුන් මඟින් අභිජනන දත්ත ගෙන්වා ගෙන දත්ත පද්ධතියක් නඩත්තු කරමින් යාවත්කාලීන කරමින් පවතියි. එමෙන්ම නිරවද්‍ය තත්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් APC මෘදුකාංගය සියලු පළාත් අධ්‍යක්ෂවරුන් (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) වෙත ලබා දී ඇති අතර, දැනට ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් සැලකිය යුතු මට්ටමින් එම මෘදුකාංගය උපයෝගී කොට ගෙන මේ වන විට අභිජනන දත්ත ලබා දෙනු ලබයි.

එසේම කෘත්‍රිම සිංචන කටයුතු සාර්ථකභාවය වැඩි කර ගැනීම සඳහා මේ වන විට දෙපාර්තමේන්තුව මඟින් පියවර රාශියක් ගෙන ඇත.

01. කෘත්‍රිම සිංචන කටයුතු සම්බන්ධ චක්‍රලේඛයක් සියළු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත නිකුත් කර ඇත.

02. එසේම කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය සම්බන්ධ මාර්ගෝපදේශයක් නිකුත් කර ඇති අතර එයද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත මෙන්ම පුද්ගලික අංශය වෙතද නිකුත් කර ඇත.

03. කෘත්‍රිම සිංචන ආවරණය වැඩි කිරීමට පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබන කෘත්‍රිම සිංචන පුහුණු සැසි ප්‍රමාණය වර්ධනය කර තිබේ.

ඩී.පී. විකුමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඒල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

03. <u>**රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් කෘතිම සිංචන සිදු කිරීම හා ගාස්තු නිර්ණය කිරීම**</u> කෘතිම සිංචන ශිල්පීන්ගේ සේවාව සඳහා ගාස්තු නිර්ණය කිරීම පිළිබඳව කාරක සභාව කරුණු විමසිය. <u>නිර්දේශ / නියෝග</u> මෙහිදී අදාළ නිලධාරීන් ප්‍රකාශ කර සිටියේ එක් එක් පළාත් සභා මගින් වෙන වෙනම රජයේ කෘතිම සිංචන ශිල්පීන්ට අදාළ ගාස්තු තීරණය කරන බවත්, පෞද්ගලික අංශයට අදාළ කෘතිම සිංචන ශිල්පීන් ඒ සඳහා ලියාපදිංචි වීමක් විය යුතු අතර ඔවුන් සඳහා ගාස්තු නිර්ණය කිරීමක් මේ වන විට සිදු නොවන බවත්ය. මෙහිදී පෞද්ගලික අංශයේ කෘතිම සිංචන ශිල්පීන් සමග සාකච්ඡා කර ගාස්තු නිර්ණය කිරීමේදී දෙපාර්තමේන්තුව මගින් යම්කිසි මැදිහත්වීමක් සිදුකරන ලෙසට කාරක සභාවට උපදෙස් දුන්නේය. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් කෘත්‍රිම සිංචන සිදු කිරීම හා ගාස්තු නිර්ණය කිරීම සඳහා මුළු දිවයිනටම එකම අකාරයේ ක්‍රමවේදයක් භාවිත කිරීමට සුදුසු නිර්ණායක සකස් කිරීම සඳහා, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරන ලද කමිටුව විසින් සකස් කළ වාර්තාව අනුව කටයුතු කරන ලෙස සියලු පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත දන්වා යවා ඇත. ඩී.පී. වික්‍රමසිංහ ලේකම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 80/5, "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

04. <u>කෘතිම සිංචන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පළාත් දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගැනීම</u>

<u>නිර්දේශ / නියෝග</u>

පළාත් දෙපාර්තමේන්තු 9 ඉදිරියේදී කැඳවීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළ කාරක සභාව අද දින කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු පිළිබඳව පළාත් දෙපාර්තමේන්තු 9 හිම අදාළ විෂයභාර නිලධාරීන් දැනුවත් කර, උපදෙස් ලබා දී, අවශ්‍ය වගකීම් පවරන ලෙස නියෝග කළේය.

I. පෞද්ගලික අංශයද සම්බන්ධ කරගෙන කෘතිම සිංචන වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
II. දැනට රජය මගින් ක්‍රියාත්මක වැඩපිළිවෙල හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම.
III. කොන්ත්‍රාත් පදනම යටතේ රජයට බඳවාගෙන සිටින සේවකයන් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම.

යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට උපදෙස් ලබාදුන් කාරක සභාව පළාත් දෙපාර්තමේන්තු 9 දැනුවත් කිරීම / වගකීම් භාර දීම පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් 2023 අගෝස්තු මස 07 වන දින වනවිට කාරක සභාව වෙත ලැබීමට සලස්වන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කරන ලදී.

මේ වන විට එනම් 2024 වර්ෂයේ අගෝස්තු මස 31 වන විට පළාත් මට්ටමින් කෘත්‍රිම සිංචන ශිල්පීන් 55 ක් පුහුණු කර අවසන් කර ඇති අතර 2024 වර්ෂයේ දෙසැම්බර් වන විට 100 දෙනෙකුට පමණ කෘත්‍රිම සිංචන පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

එසේම කෘත්‍රිම සිංචනය තව දුරටත් විධිමත් කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන යටතේ (Public Privet Partnership - PPP) පුද්ගලික කිරි නිෂ්පාදන ආයතනය 07 ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර කෘත්‍රිම සිංචන කටයුතු වැඩි දියුණු කිරීමට කටයුතු කර ගෙන යනු ලබයි.

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක **SML/03/03/17/2021** හා **2023.08.23** දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.	

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, ඉඟු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඒල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර,

05. <u>කිරි නිෂ්පාදනය වැඩිකිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම</u> රටේ දෛනික දියර කිරි අවශ්‍යතාවයෙන් 40% ක ප්‍රමාණයක් පමණක් රටතුළ නිෂ්පාදනය වීම සම්බන්ධයෙන් කාරක සභාව මෙහිදී කරුණු විමසීය. රටේ දියර කිරි නිෂ්පාදනය 2009-2018 දක්වා කාලය තුළ වාර්ෂිකව වර්ධනය වී ඇතත්, වාර්ෂික දියර කිරි ඉල්ලුම ද ඊට සාපේක්ෂව වැඩි අගයකින් වර්ධනය වී ඇතැයි ද, මේ නිසා විදේශීය නිෂ්පාදන වෙළෙඳපොළට පැමිණ ඇති බව අමාත්‍යාංශ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සම්ප්‍රදායික සුළු පරිමාණ ගොවීන් ව්‍යවසායක මට්ටමට වර්ධනය කිරීම සඳහා කිරි ලීටර 100 ගොවිපොළවල් 15000 ක් සංවර්ධනය කිරීමට වැඩපිළිවෙලක් මේ වනවිට ආරම්භ කර ඇති බව ද අමාත්‍යාංශ නිලධාරීහු ප්‍රකාශ කර සිටියහ. 2016 ජූලි මස 21 දින පවතී කමිටු රැස්වීමේදී ද මෙම කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වූ කරුණු පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව කිරි නිෂ්පාදනය වැඩි කරලීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කළ සැලසුම් හා පියවර පිළිබඳව වැඩිදුරටත් ප්‍රශ්න කළේය.	කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය, ක්ෂේත්‍රයට අදාළ සියළු පාර්ශවකරුවන්, ප්‍රතිලාභීන්ගේ හා ජාත්‍යන්තර විශේෂඥ දැනුමද යොදාගෙන, සාකච්ඡා වට කිහිපයක්ද පවත්වා දළ වාර්තාව නිම කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිර"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වැඩිමි සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

<u>නිර්දේශ / නියෝග</u>

එහිදී,

i. අමාත්‍යාංශය විසින් කිරි නිෂ්පාදනය වැඩි කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා වර්තමානයේ පත් කරන ලද කමිටු සාමාජිකයන්ගේ පත්වීම් ලිපි හා කමිටුවේ සංයුතිය ඇතුළත් වාර්තාවක් 2023 ජූලි මස 19 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙසත්,

ii. සකස්කර කරන ලද ජාතික සැලැස්ම අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ දින වකවානු ඇතුළත් වාර්තාවක් 2023 අගෝස්තු මස 07 දිනට පෙර කාරක සභාව වෙත ලබාදෙන ලෙසත්,

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව නියෝග කරන ලදී.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

06. <u>එළුවන් සඳහා කෘතිම සිංචන කටයුතු සිදු කිරීම වාර්ෂිකව අඩු මට්ටමක පැවතීම</u> එළුවන් සඳහා කෘතීම සිංචන කටයුතු සිදු කිරීම වාර්ෂිකව අඩු මට්ටමක පැවතීම මෙහිදී කාරක සභාවේ අවධානයට ලක්විය. එළු අභිජනනය ස්වාභාවිකවම සිදු කිරීම සාර්ථක නම් එය ව්‍යාප්ත කිරීමටද, කෘතීම සිංචනය සිදු කිරීම ඊට වඩා සාර්ථක නම් එයට තිබෙන අඩු කිරීමට හේතු වූ කරුණු සොයා බලන ලෙස ද කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් ලබා දුන්නේය.	ක්ෂේත්‍රයේ එළු කෘත්‍රිම සිංචන කටයුතු සඳහා ඉල්ලුමට සරිලන ප්‍රමාණවත් ශුක්‍ර වඩි දෙපාර්තමේන්තුව සතුව පවතියි. ක්ෂේත්‍රයේදී ගොවීන් විසින් පට්ටි එළුවන් යොදා ගනිමින් එළු අභිජනන කටයුතු බහුලව සිදු කරයි. මීට හේතු ලෙස සතුන් රංචු ලෙස ඇති කිරීමත්, මද ලකුණු හඳුනා ගැනීමේ අපහසුව නිසා අභිජනනයට පට්ටි වස්සන් යොදා ගැනීම සාර්ථක බව පෙනී ගොස් ඇත. නමුත් සූක්ෂම ක්‍රම යටතේ ඇති දැඩි කරනු ලබන එළු ගොවිපල වල කෘත්‍රිම සිංචන කටයුතු සිදු කිරීම යම් සාර්ථකභාවයක් පෙන්නුම් කරන බැවින් ඒ සඳහා අවශ්‍ය කරන යෙදවුම් ලබා දීම සිදු කරනු ලබයි. ක්ෂේත්‍රයේ පවතින පට්ටි එළු ඉල්ලුම සපුරාලීමට දෙපාර්තමේන්තුව මඟින් තෙලහැර හා ඉඹුලන්දණ්ඩ ප්‍රදේශ වල ත්‍යාෂ්ටික ගොවිපොල දෙකක් පවත්වාගෙන යනු ලබයි. නමුත් දිගින් දිගටම සතුන් අතර CAE රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් මෙම ගොවිපළ වලින් ක්ෂේත්‍රයට සතුන් නිකුත් කිරීම තාවකාලිකව නවතා ඇත. මේ වන විට පළාත් මට්ටමින් කෘත්‍රිම සිංචනය මඟින් එළු අභිජනනය ප්‍රවලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතියි.

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූලික නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වැඩිමි සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

07. <u>කෘතිම සිංචනය මඟින් බිහිවන තෝරාගත් වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය</u> මෙම ව්‍යාපෘතියේ සත්ත්ව ලියාපදිංචි කටයුතු වාර්ෂිකව අඩු වී ඇති බවත් අදාළ ප්‍රතිපාදන පළාත් සභා වෙත ලබාදීම සිදු කළද එම මුදල් අදාළ ව්‍යාපෘතිය සඳහා නිසි අයුරින් යොදවා තිබේද යන්න පිළිබඳව කාරක සභාව විමසීමක් කළේය. **<u>නිර්දේශ / නියෝග</u>** මේ සඳහා ක්‍රියාත්මක සමස්ත වැඩපිළිවෙල පිළිබඳව සංඛ්‍යාලේඛන ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙසට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	මෙම ව්‍යාපෘතිය 2023 වසර තුළ අවසන් වූ අතර, එහි ප්‍රගතිය පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් ඉදිරි දත්ත විශ්ලේෂණ කටයුතු සඳහා උපයෝගී කර ගනු ලබයි.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

08. <u>රජය සතු ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර අභිජනන මධ්‍යස්ථානවල සිටින ආනයනික එළුවන් නිරෝධායන කාලසීමාව තුලදී හා ඉන්පසු කාලය තුළදී රෝගවලට භාජනයවීම, මිය යාම හා ඔවුන් බිහි කළ පැටවුන් බොහෝමයක් මිය යාම</u>

මෙම සතුන්ගේ සෞඛ්‍ය පිරිහීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතු බවත් සතුන් ආනයනයේදී නිසි පියවර හා ආනයන ගිවිසුම් කොන්දේසි සකස් කර තිබේද යන්න පිළිබඳවත් කාරක සභාවේ අවධානයට යොමු විය. සතුන් ආනයනයේදී ඕස්ට්‍රේලියාවේ රෝග නිරෝධායන සහතිකය ලබා ගෙන ආනයනය කළ බවත්, නිරෝධායන කල සීමාව සකස් කරන ලද ගිවිසුමෙහි සඳහන් කර නොමැති බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීහු ප්‍රකාශ කළහ.

<u>නිර්දේශ / නියෝග</u>

මීට අදාළ විධිමත් පරීක්ෂණයක් සිදු කර සම්පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙස හා එමගින් අදාළ සතුන් ආනයන කාර්යය සම්බන්ධයෙන් විදේශගත වූ නිලධාරීන් හා අදාළ තාක්ෂණ ඇගයුම් කමිටුවේ (Technical Evaluation Committee) සිටි නිලධාරීන්ගේ යම් අකාර්යක්ෂමතාවයක් හෝ නොසැලකිල්ලක් ඔප්පු වුවහොත් එම වරද සඳහන් කරමින් අවම වශයෙන් ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු වලට අවවාදාත්මක ලිපියක් හෝ ඇතුළත් කළ යුතු බවත් මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඉඹුලන්දණ්ඩ එළු අභිජනන ගොවිපොළ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සඳහා අමාත්‍යාංශය විසින් කමිටුවක් පත්කරන ලදුව එම කමිටුව විසින් 2024.01.10 දින ගොවිපොළෙහි සතුන් පරීක්ෂාකර CAE අසාධිත සතුන් ඉවත් කර CAE රෝගයෙන් තොර එළු ගහනයක් පවත්වා ගැනීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර ඇත.

2024 ජුනි මාසයේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද විශේෂඥ කමිටු නිර්දේශයෙහි මෙම ගොවිපොළෙහි ඇති තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා නිර්දේශ 7 ක් දී ඇති නමුත් ඉන් කිසිදු නිර්දේශයක ආසාධනය වූ සතුන් අපහරණය කිරීමට හැර සියළු සතුන් අපහරණය කළ යුතු ද නැද්ද යන්න සඳහන් කර නැත.

මෙසේ තිබියදී 2024/07/16 දිනැති අධ්‍යක්ෂ (සත්ත්ව අභිජනන) ගේ හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් ඉඹුලන්දණ්ඩ එළු ගොවිපොළෙහි සියළුම සතුන් අපහරණය සඳහා අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ඇත. එහෙත් අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුව විසින් සියළුම සතුන් අපහරණය කිරීමට නිර්දේශ ලබා දී නොමැත.

විශේෂඥ කමිටුව මගින් දෙන ලද නිර්දේශයන්හි ද ආසාධනය වූ සතුන් ගොවිපොළෙන් ඉවත් කිරීමටත් නිරෝගි සතුන් තෝරා ඔවුන් නිවැරදි අභිජනන සැළැස්මකට අනුව අභිජනනය කළ පැටවුන් බෙදා දීමටත් යෝජනා කර ඇත. එයට අමතරව මෙම එළු අභිජනන මධ්‍යස්ථානය තවදුරටත් ත්‍රාෂ්ඨීක අභිජනන මධ්‍යස්ථානයක් ලෙස මෙම තත්ත්වයන් යටතේ පවත්වාගෙන යාම නුසුදුසු බවට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද විශේෂඥ කමිටුව සහ අමාත්‍යාංශය විසින් පත් කරන ලද විශේෂඥ කමිටුව විසින් යෝජනා කර ඇත. ඊට අමතරව පහත නිර්දේශ ද ඉදිරිපත් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වනජීව සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	1. මෙම ආසාධිත සතුන් කඩිනමින් අපහරණය කිරීම. 2. CAE රෝගය මෙරටට අලුතින් ඇතුළු වූ රෝගයක් වුවද ගොවිපොළෙන් සතුන් නිකුත් කර ඇති බැවින් මේ පිළිබඳ දිවයින පුරා ආවේක්ෂණ අධ්‍යනයක් කිරීම 3. මෙම අභිජනන ගොවිපොලෙහි පවතින සම්පත් ප්‍රමාණය සැළකිල්ලට ගෙන මෙම ගොවිපොළ න්‍යෂ්ටික අභිජනන ගොවිපොළක් ලෙස නොව වාණිජ ගොවිපොළක් ලෙස පවත්වාගෙන යා හැකි හෙයින් ආසාධිත සතුන් පරීක්ෂා කර හඳුනා ගනිමින් ඔවුන් කඩිනමින් අපහරණය කිරීමට ද, අලුතින් උපදින පැටවුන් කඩිනමින් වෙන් කිරීම සහ ඔවුන්ගේ නිරෝගීතාවය පරීක්ෂා කර ක්ෂේත්‍රයට පැටවුන් බෙදාහැරීම ද ආසාධිත සතුන් මස් පිණිස ගොවිපොළෙන් ඉවත් කිරීම පශු වෛද්‍ය අධීක්ෂණය යටතේ සිදු කිරීම. ඉහත නිර්දේශ සැලකිල්ලට ගෙන අමාත්‍යාංශය මගින් ඉඹුලන්දණ්ඩ එළු අභිජනන ගොවිපොළ පවත්වාගෙන යාම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දී ඇත.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛකි
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩබ්ලිව්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

09. <u>කරඳගොල්ල මධ්‍යම කුකුල් පර්යේෂණ ආයතනයේ පැටවුන් නිෂ්පාදනය පහත වැටීම.</u>

ඉන්ධන හා විදුලි අර්බුදය ඇතුළු ගැටළු හේතුවෙන් රක්වනාගාරය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් සත්ත්ව ආහාර ලබා ගැනීමටද නොහැකි වූ බවත් එනිසා මෙහි සිටින සතුන් සංඛ්‍යාවද අඩු කිරීමට තීරණය කළ බවත් නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ / නියෝග</u>

මෙම කුකුළු පැටවුන් නිෂ්පාදනය පහත වැටීම සම්බන්ධයෙන් වාර්තාවක් 2023 ඔක්තෝබර් 03 ට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුලදී මෙම මධ්‍යස්ථානයේ පැටවුන් නිෂ්පාදනය පහත සඳහන් පරිදි විය.

වර්ෂය	පැටවුන් නිෂ්පාදනය		එකතුව
	පිරිමි	ගැහැණු	
2018	58601	62105	120706
2019	62204	65705	127909
2020	49824	52439	102263
2021	50378	52986	103364
2022	38612	39577	78189
2023	59285	65266	124551

2021 හා 2022 වර්ෂ වලදී රට තුල උද්ගත වූ කොවිඩ් වසංගත තත්ත්වය හා ඉන්ධන අර්බුධය මත සිදු වූ ප්‍රවාහන කටයුතු සීමාවීම, විදුලි අර්බුධය, විදේශ විනිමය අර්බුධ තත්ත්වය මත කුකුල් ආහාරවල මිල ගණන් දිනෙන් දින ඉහළ යාම, කුකුල් ආහාර සැපයුම්කරුවන් හට නියමිත කාලය තුලදී ආහාර ඇණවුම් සැපයීමට නොහැකි වීම, විශේෂයෙන්ම සතුන් ඉල්ලීම් ප්‍රමාණ අඩුවීම වැනි හේතු මත නිෂ්පාදන ධාරිතාව උච්චාවචනය වීම වැනි එකිනෙක බැඳුණු සිදුවීම් හා රටතුල උද්ගත වූ ආර්ථික තත්ත්වයන් තුල සිදු කළ ප්‍රතිපාදන සීමා කිරීම වැනි සිදුවීම්ද මෙම තත්ත්වයට බලපා ඇති බව දන්වමි. ඒ අනුව අදාල ගැටළු යථා තත්ත්වයට පත්වන තෙක් මෙම ගොවිපල අවම ධාරිතාවයක් යටතේ පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද

එම්.එච්.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. විත්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වනජීව සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

	විශේෂ තීරණයක් මත කටයුතු සිදු කර ඇති බව දන්වමි. එසේ වුවද 2023 වර්ෂය වන විට එම ගැටළු නිරාකරණය වී ඇති බැවින් ඉලක්ක ගත ධාරිතාවය වෙත ළඟාවී ඇති බවද වැඩිදුරටත් දන්වමි.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,

10. <u>කරඳගොල්ල හා සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයන්හි අධ්‍යයන කටයුතු සඳහා ශීෂ්‍ය ලියාපදිංචිය අඩුවීම, සිසුන් පාඨමාලා හැරයාම හා අධ්‍යයන කාර්ය මණ්ඩල හිඟය</u> මෙම ආයතන පූර්ණ ශිෂ්‍ය ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවන බවත්, පාඨමාලා සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබෙන බවත්, පාඨමාලාව අතරතුර වෙනත් පාඨමාලා සඳහා ශිෂ්‍යයන් පාඨමාලාව හැරයන බවත් නිලධාරීහු ප්‍රකාශ කළහ. <u>නිර්දේශ / නියෝග</u> අය කිරීමකින් තොරව අදාළ පුහුණුව ලබා දෙන බැවින් සිසුන් ලියාපදිංචි කිරීමේ දී ගිවිසුමකට එළඹීමේ හැකියාව පිළිබඳ විමසා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙසට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	සිසුන් ලියාපදිංචි කිරීමේදී ගිවිසුමකට එළඹීමට ඉදිරියේදී සැලසුම් කර ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

11. <u>අධ්‍යයන/ රාජකාරි/ විවිධ වැඩසටහන් සඳහා විදේශගතවූ නිලධාරීන් විසින් රජයට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම</u> විදෙස්ගතවීම ඕනෑම පුද්ගලයෙකු සතු අයිතියක් වුවද ඒ සඳහා වැය බර රජය මගින් දරන්නේ නම් ඊට අදාළ සේවය ඔහු විසින් පෙරළා රටට සැපයිය යුතු බව කාරක සභාව ප්‍රකාශ කළේය. <u>නිර්දේශ / නියෝග</u> අධ්‍යන / රාජකාරි / විවිධ වැඩසටහන් සඳහා විදේශගත වී නැවත ලංකාවට නොපැමිණි නිලධාරීන්ගේ නම්, ඔවුන්ගේ ගිවිසුම් සඳහා අත්සන් කළ නිලධාරීන්ගේ නම් සහ රජයට අයවිය යුතු මුදල් ආපසු අයකර ගැනීම පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත යොමු කරන ලෙසත්, ගිවිසුම් සඳහා අත්සන් කළ නිලධාරීන් අයත් අමාත්‍යාංශයන්හි ලේකම්වරුන්ට දන්වා ඔවුන්ගේ මාසික වේතන වලින් එම මුදල් අයකර ගැනීමේ හැකියාව සොයා බලන ලෙසත්, රජය මගින් පනවා ඇති වක්‍රලේඛවලට පටහැනිව අනුමත කරගත් කාලසීමාව ඉක්මවා විදේශයන්හි රැඳී සිටින නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. එල්.පී.එස්. කුමාර ප්‍රධාන මූල්‍ය නිලධාර කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය අංක. 80/5, "ගොවිජන මන්දිරය"	මෙයට අදාළ පිළිතුරු ඇමුණුම් අංක 01 න් දක්වා ඇත. ඩී.පී. වික්‍රමසිංහ ලේඛාම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 80/5, "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර, බත්තරමුල්ල

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක **SML/03/03/17/2021** හා **2023.08.23** දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.	

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛාධි
කෘෂිකර්ම, පශු සම්පත්, ඇඹරි සහ විවිධාර්ථ අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

12. <u>විදේශගත වූ සේවකයන් සම්බන්ධයෙන් නැවත සේවයට වාර්තා කිරීම</u> **<u>නිර්දේශ / නියෝග</u>** විදේශගත වූ සේවකයන් සම්බන්ධයෙන් නැවත සේවයට වාර්තා නොකරන අය සම්බන්ධව පැන නැඟී තිබෙන ගැටළු සැලකිල්ලට ගෙන නීතිපතිගේ ද උපදෙස් ලබාගෙන පොදු වක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	මෙයට අදාළ පිළිතුරු ඇමුණුම් අංක 01 න් දක්වා ඇත.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වැඩිදියුණු කිරීම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,

13. <u>බිත්තර හා මාංශ මිල වසර තුල උච්චාවචනය වීම සම්බන්ධයෙන්ද මෙහිදී කාරක සභාවේ අවධානය යොමු විය.</u>

මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග.නි. ප්‍රකාශ කර සිටියේ මාංශ මිළ සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවතින බවත්, 2022 වසරේ දී බිත්තර දැමීම සඳහා කුකුළු පැටවුන් ආනයනය කිරීම අගෝස්තු මාසය වනතුරු නිසි ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වූ බවත්, එම වසරේ ආනයනය සම්පූර්ණ අවශ්‍යතාවයෙන් 50%ක් වීම බිත්තර මිල ඉහල යාමට හේතු වූ බවත් ය.

වසරේ දෙසැම්බර් මාසයේ දී බිත්තර හා මාංශ මිළ ඉහල යාම සාමාන්‍ය තත්ත්වයක් බවත් වැඩිදුරටත් ප්‍රකාශ විය.

2023 වර්ෂයේ ලේයර් මව් සතුන් 116,935 ක් ආනයනය කරන ලදී. බිත්තර නිෂ්පාදනය යථාවත් කිරීම කඩිනම් කිරීම සඳහා මීට අමතරව සංසේචිත බිත්තර (Hatching eggs) මිලියනයක් ආනයනය කර එම බිත්තර වලින් අතිරේකව පැටවුන් 500,000 ක් නිෂ්පාදනය කර බෙදා හරින ලදී.

ඒ අනුව 2023 වර්ෂයේ ලේයර් පැටවුන් මි. 7.17 ක් බිත්තර නිෂ්පාදනය සඳහා අලෙවි කර ඇත.

කුකුළු මස් නිෂ්පාදනය 2023 වර්ෂයේදී මෙ. ටො. 236.11 ක් වූ අතර, 2024 වර්ෂය අවසාන වන විට මෙ. ටො. 262.95 ක ඉලක්කයක් ලඟාකර ගැනීමට අපේක්ෂිතය.

නිෂ්පාදනය ඉහළ යාමත්, ආහාර අමුද්‍රව්‍ය වල මිල යම් දුරකට පහත වැටීමත් හේතුවෙන් 2023 දෙසැම්බර් මස රු. 55.00 ක් හා රු. 1,247.00 ක් ලෙස පැවති බිත්තර සහ කුකුළු මස් වල විකුණුම් මිල 2024 අගෝස්තු මස වන විට රු. 43.00 ක් සහ රු. 1,220.00 ක් (මූලාශ්‍රය HARTI) සහ අධි ශීතනය කළ කුකුළු මස් විකුණුම් මිළ රු. 1,150.00 ක් දක්වා පහත වැටී ඇත.

2024 වර්ෂයේ ජූලි මස වන විට ලේයර් මව් සතුන් 38,662 ක් ආනයනය කර ඇති අතර, ඒ දක්වා ලේයර් පැටවුන් මි. 6.51 ක් නිෂ්පාදනය කර අලෙවි කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ජූලි මස දක්වා බිත්තර නිෂ්පාදනය මි. 1,567.14 ක් පමණ වන අතර වර්ෂය අවසන් වන විට මි. 3,015.83 ක නිෂ්පාදනයක් ලඟා කර ගැනීමට නියමිතය. මේ අනුව ඉල්ලුම හා සැපයුම මත මේ වන විට (2024 සැප්තැම්බර්) බිත්තරයක මිල රු.30.00 ට වඩා අඩුවෙන් ගොවිපල වෙතින් (Farm gate) හා රු.35.00 ට අඩුවෙන් වෙළඳපොළේ අලෙවි වේ.

ඩබ්.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත
අංක. 80/5, "ගොවිජන
රජමල්වත්ත පට්ටි
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛාම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

14. <u>දීප ව්‍යාප්ත පශු වෛද්‍ය කාර්යාල මඟින් සිදු කරන සේවාව පුළුල් කිරීම</u> සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පශු වෛද්‍ය කාර්යාල හා සම්බන්ධීකරණය සිදු කරන ආකාරය පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය. <u>නිර්දේශ / නියෝග</u> මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග.නි. ප්‍රකාශකර සිටියේ ලංකාවේ පශු වෛද්‍ය කාර්යාල 37 හි පරිපාලනය පළාත් සභා යටතට ගැනෙන බවත් තම දෙපාර්තමේන්තුව මඟින් පර්යේෂණ කටයුතු හා සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති සකස් කිරීම ආදී කටයුතු සඳහා මාස 3කට පමණ වරක් ඔවුන් කැඳවා සාකච්ඡා කරන බවත්ය. ඉදිරි කාලයේ දී එම පළාත් 9 හි අධ්‍යක්ෂවරුන් හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛය දෙපාර්තමේන්තුව එකම දිනයක දී කැඳවීමට අදහස්කරන බව ප්‍රකාශ කළ කාරක සභාව පළාත් දෙපාර්තමේන්තු හා ප්‍රාදේශීය මට්ටමින් ඇති පශු වෛද්‍ය කාර්යාල වලට අයත් ප්‍රදේශය තුළ ඇති පශු සම්පත් පිළිබඳව නිශ්චිත සංඛ්‍යාත්මක තොරතුරු තබා ගැනීම හා පශු වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය ඉවත් කිරීමටත් ආයතනික / සේවක ඵලදායිතාවය වැඩිකිරීම සඳහාත් සුදුසු ඉලක්කගත වැඩපිළිවෙලක් සකස් කර, ඒ සඳහා අදාළ ඉලක්ක ලබා දී මේ සම්බන්ධයෙන් අවශ්‍ය වක්‍රලේඛ සහ උපදෙස් පත්‍රිකා පළාත් 9 හි ම අධ්‍යක්ෂකවරුන්	මේ සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නියෝජනය වන සේ කමිටුවක් පත් කර අධ්‍යනයකින් පසුව වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතය.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,

වෙත නිකුත් කර එම කාර්යාල නිරන්තර අධීක්ෂණයට ලක් කරන ලෙසත්, දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත සේවය ලබාදීමට විශේෂ අවධානයක් ලබා දී කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳව කාරක සභාව දැනුවත් කරන ලෙසත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී.	

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූලප නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත
අංක. 80/5, "ගොවිජන
රජමල්වත්ත පදු
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, වැවිලි සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

15. <u>කුර හා මුඛ රෝග සඳහා එන්නත් වඩි 100,000 ක් මිලදී ගැනීමේදී වෙළඳපොල මිලට වඩා වැඩි මිළක් ගෙවා තිබීම</u> 2020 වර්ෂයට අදාළව විගණකාධිපති වාර්තාවේ 3.7(අ)(V) හි සඳහන් කර ඇති මෙම මිළදී ගැනීමේ දී රුපියල් මිලියන 3.9 ක පමණ වැඩිපුර මුදල් ප්‍රමාණයක් ගෙවා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. මෙහිදී එක ලංසුකරුවෙකු පමණක් ඉදිරිපත් වූ හෙයින් එම මුදලට අදාළ මිලදී ගැනීම සිදුකළ බව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග.නි. ප්‍රකාශ කර සිටියේය. දෙපාර්තමේන්තුවේ හිටපු ප්‍රධාන ගණකාධිවරයාද ලිඛිතව කරුණු පෙන්වා දී ඇති බව ප්‍රකාශ කළ කාරක සභාව මෙම කාරණය දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡාවට භාජනය වී නොමැති බව ද නිරීක්ෂණය කළේය. **<u>නිර්දේශ / නියෝග</u>** මෙම වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝගය මත ගිණුම් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඩී.පී. වික්‍රමසිංහ ලේකම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 80/5, "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඩබ්ලිව්.පී.ඩබ්ලිව්.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර්
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,

16. <u>සත්ත්ව රෝග සඳහා අවශ්‍ය කරන ඖෂධ ඇතැම් ප්‍රදේශවල නොමැති වීම</u> සත්ත්ව රෝග සඳහා අවශ්‍ය කරන ඖෂධ වර්ග ඇතැම් ප්‍රදේශවල පිහිටි පශු වෛද්‍ය කාර්යාල සතුව නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළේය. වසංගත රෝගී තත්ත්ව පැතිරෙන අවස්ථා වලදී ඒ සඳහා අවශ්‍ය එන්නත් ලබාදීම මධ්‍යම රජය විසින් නොමිලේ සිදු කරන බවත්, වසංගත රෝග සඳහා අවශ්‍ය එන්නත් සෑදීම මෙරටදීම සිදුකරන අතර සතුන්ට එදිනෙදා සෑදෙන ලෙඩරෝග සඳහා අවශ්‍ය බෙහෙත් හිඟයක් පළාත් මට්ටමින් පවතින බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග.නි. ප්‍රකාශ කර සිටියේය. **<u>නිර්දේශ / නියෝග</u>** මේ සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු 9 න්ම වාර්තා ගෙන්වා ගෙන (පළාත් අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය මත) ඒ ඒ පළාත්වල පවතින සත්ත්ව බෙහෙත් අවශ්‍යතාවය පිළිබඳ වාර්තාවක් 2023 ජූලි මස 25 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නියෝග කරන ලදී. **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක SML/03/03/17/2021 හා 2023.08.23 දිනැති ලිපියෙන් උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**	කෘතිම සිංචන හා පශු වෛද්‍ය සේවා ගාස්තු තීරණය කිරීමට අදාළ කමිටුව විසින් මේ සඳහා යෝජනා ලබා දී ඇත. එම යෝජනා වනුයේ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන අවශ්‍ය කරන ඖෂධ මිලදී ගෙන සැපයීමට කටයුතු කිරීමයි. දැනට JICA ආයතනය මඟින් අත්‍යාවශ්‍ය ඖෂධ ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර ඒ සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතුද අවසන් කර ඇත. එම ඖෂධ මේ වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර ඒවා පළාත් වෙත බෙදා දී ඇත.

එල්.ඒ.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

17. <u>පශු වෛද්‍ය කාර්යාල හරහා සුරතල් සතුන්ට එන්නත් කිරීම හා රාජකාරි කාලය තුල ඒ සඳහා පෞද්ගලික ගාස්තු අය කිරීමක් සිදු කරන්නේද යන්න</u> පශු වෛද්‍ය කාර්යාල හරහා සුරතල් සතුන්ට එන්නත් කිරීම හා රාජකාරි කාලය තුළ ඒ සඳහා පෞද්ගලික ගාස්තු අය කිරීමක් සිදු කරන්නේ ද යන්න සහ එම මුදල් රජයේ අරමුදලකට බැර කරන්නේ ද යන්න පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කළේය. මෙහි එක් එක් පළාත් සභා සතු බලතල වලට අනුව විවිධ ක්‍රමවේද වලට මුදල් අය කරන බවත්, නමුදු එසේ අය කරන මුදල් රජයේ අරමුදලකට බැරකිරීම සිදු කරන බවත්, මෙම ක්‍රියාවලිය එකම ක්‍රමවේදයකට අනුගත කිරීමට දැරූ උත්සාහයන් ව්‍යාර්ථ වූ බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිළධාරීන් ප්‍රකාශකර සිටියහ. <u>නිර්දේශ / නියෝග</u> මෙම සේවාව සඳහා ගාස්තු නිර්ණය කිරීම ඇතුළුව පළාත් සභා සියල්ලෙහිම මෙම ක්‍රියාවලිය එකම ක්‍රමවේදයකට අනුගත කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් නියෝග කරන ලදී.	රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධව 2012.03.21 දිනැති දෙපාර්තමේන්තු වක්‍රලේඛ 01/2012 සංශෝධනය කර අංක 09/2024 හා 2024.09.20 දිනැති වක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී ඇත. ඩී.පී. වික්‍රමසිංහ ලේඛකම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 80/5, "ගොවිජන මන්දිරය" රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

අධ්‍යයන/ රාජකාරී/ විවිධ වැඩසටහන් සඳහා විදේශගත වූ නිලධාරීන් විසින් රජයට ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම. ඇමුණුම 01

විදේශගත වූ සේවකයන් සම්බන්ධයෙන් නැවත සේවයට වාර්තා නොකිරීම

අනු අංකය	නිලධාරියාගේ නම	ගිවිසුමට සාක්ෂි ලෙස අත්සන් කර ඇති නිලධාරීන්	විදේශ ගත වී ඇති කාරණය	අයවිය යුතු දණ්ඩන මුදල	2024.09.10 දිනට ගෙවා ඇති මුදල	අයවිය යුතු ඉතිරි මුදල	මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	ටී. සිවකුමාර් මයා	2010.09.15 – 2013.10.15 කාලයට අදාළව සාක්ෂිකරුවන් අත්සන් තබා නැත. 2013.10.31 – 2015.10.31 01. prof. Ikuo igarashi 02. prof. Naoaki yokoyama	අධ්‍යයන කටයුතු	රු.1,172,255.00	රු.650,000.00	රු.522,255.00	ටී. සිවකුමාර් මයා හට හිඟ මුදල් ගෙවන ලෙසත් නැතහොත් නීති කටයුතු අරඹන බවත් 2024.05.22 දිනැතිව විද්‍යුත් තැපෑල මගින් දැනුම් දී ඇත.
02.	ඩබ්.ඒ.එම්.බී. කේ. අබයරත්න	(2017.06.25 – 2020.06.24) කාලයට අදාළව 01. James Edward john suyton	රැකියා කටයුතු	රු.754,392.00	රු.251,464.00	රු.502,928.00	ඩබ්.ඒ.එම්.බී.කේ. අබයරත්න මයා ගෙවීම් පැහැර හැර ඇති බැවින් නීති කටයුතු අරඹන ලෙස 2024.08.05 දිනැතිව නීතිපති දැනුවත් කර ඇත.

ඩබ්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛාධි
කෘෂිකර්ම, පශු සම්පත්, දේශීය සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

03.	ජේ.එම්.කේ.ජී. ජයසුන්දර මිය	2013.02.10 – 2016.02.21 දක්වා කාලයට අදාළව 01. ඒ.බී.එච්.හිමාලී ප්‍රියදර්ශනී මිය 02. ඩී.එම්.මුදිතා දර්ශනී මිය 2013.02.10 – 2017.05.05 දක්වා කාලයට අදාලව 01. ඩබ්.ඩී.කේ. සිල්වා මිය (පරි.නි.) 02. ඩී.එම්.ජී.ඒ.එම්. දාරපොකුණ (පරි .නි.)	අධ්‍යයන කටයුතු	රු.10,856,659.40	රු.9,758,659.40	රු.1,098,000.00	ජේ.එම්.කේ.ජී. ජයසුන්දර මියගේ දණ්ඩන මුදල් අයකර ගැනීමට අදාළව කොළඹ දිසා අධිකරණයේ නඩුව විභාග වෙමින් පවතී.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාර
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

04.	ජී.වයි.ඩබ්. කුමාරි මිය	2008.07.06 – 2010.07.26 01.එම්.අයි.ජී. ජයතිලක මයා/ මිය 02.එච්.ඒ. මහින්දරත්න මයා 2011.01.18 සිට 2016.01.18 දින දක්වා 01. ඩබ්.ඒ.නිමල් රාජපක්ෂ මයා 02.සී.පී.සී.පී. ගුණසේකර මයා/මිය	රැකියා කටයුතු	රු. 986,580.00	-	රු.986,580.00	ජී.වයි.ඩබ්. කුමාරි මියට අදාළව රු.986,580.00 ක මුදලක් අයකර ගත යුතුව ඇති අතර ඊට අදාළව නඩු කටයුත්තක් ආරම්භ කිරීමට 2021.07.19 වන දින නීතිපතිට දන්වා ඇත. නිවැරදි ලිපිනය සොයා ගත නොහැකි බැවින් මේ වන විට නඩුව පවරා නැත. නිවැරදි ලිපිනය සොයා ගැනීම සඳහා ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් 2022.12.19 දින දැනුම් දී ඇත. ඊට අමතරව ඇය ලංකාවට පැමිණෙන විට දැනුම් දීම සඳහා ආගමන විගමන පාලක ජනරාල් ලිඛිතව දැනුවත් කර ඇත.
05.	ලතාමනී ඉන්ද්‍රකුමාර් මිය	2006.04.25 – 2008.04.25 කාලයට අදාළව 01. ටී.ඒ.සී.තිස්ස කුමාර මිය. 02. එස්.ඒ.ඒ.පී. සමරසුන්දර මිය	රැකියා කටයුතු	රු. 435,200.00	-	රු. 435,200.00	ලතාමනී ඉන්ද්‍රකුමාර් මියට අදාළව රු. 435,200.00 ක මුදලක් අයකර ගත යුතුව ඇති අතර ඊට අදාලව නඩු කටයුතු ආරම්භ කරන ලෙස 2013.12.20 දිනැතිව නීතිපති දැනුවත් කර ඇත. ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීම සඳහා එම නිලධාරිනියගේ වර්තමාන

ටී.ඒ.සී. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"

සී.පී. වික්‍රමසිංහ
ලේඛාධි
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

							ලිපිනය සොයාගත නොහැකි බැවින් විදේශ ලිපිනයන් හා විදේශ ගමන් බලපත්‍ර තොරතුරු ලබා දෙන ලෙස ආගමන විගමන පාලක ජනරාල් 2018.07.17 දිනැතිව දැනුවත් කර ඇත. 2019.12.23 දිනැතිව විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මගින් කැනඩා මහ කොමසාරිස් වෙත එම නිලධාරිණියගේ වර්තමාන ලිපිනය දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. ආගමන විගමන දෙපාර්තමේන්තුව සතුව එම නිලධාරිණියගේ විදේශ ලිපිනයන් හෝ ඊ මේල් ලිපිනයන් නොමැති බව දැනුවත් කර ඇත. අදාළ නිලධාරිනිය සම්බන්ධයෙන් තොරතුරක් සොයා ගැනීමට හැකියාවක් පවතී නම් දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙස 2022.10.07 දිනැති ලිපියෙන් විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත. ඊට අමතරව ඇය ලංකාවට පැමිණෙන විට දැනුම් දීම සඳහා 2024.07.23 දිනැති ලිපියෙන් ආගමන විගමන පාලක ජනරාල් ලිඛිතව දැනුවත් කර ඇත.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

06.	ඩී.එම්.ඩබ්.සී. බී. දිසානායක මයා	2016.06.14 – 2019.06.02 01.නිලුක්ෂි ලියනගුණවර්ධන මිය 02. කේ.එම්.එස්.සී. වීරසූරිය මිය / මයා	රැකියා කටයුතු	රු. 2,022,013.00	-	රු. 2,022,013.00	ඩී.එම්.ඩබ්.සී.බී. දිසානායක මයාගෙන් දණ්ඩන මුදල් අයකර ගැනීමට අදාළව නීති කටයුතු අරඹන ලෙස 2024.08.21 දිනැතිව නීතිපති වෙත යොමුකර ඇත. ඩී.එම්.ඩබ්.සී.බී.දිසානායක මයා ලංකාවට පැමිණීමේදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලෙස 2024.01.21 දිනැතිව ආගමන විගමන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පරිපාලන අංශයේ නිලධාරීන් 2024.09.12 දින කැඳවන ලදී.

එල්.සී.එෆ්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කාර්මික හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කාර්මික, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

07	එම්. නන්දා නායකරත්න මිය	1991.06.07 සිට 1997.06.07 දින දක්වා 01.එම්.පී. විල්ෆ්‍රඩ් මයා 02. කේ.එම්. කුඩාමැණිකේ මිය	රැකියා කටයුතු	රු. 98,049.00	-	රු.98,049.00	එම්. නන්දා නායකරත්න මියට අදාළව රු. 98,049.00 ක මුදලක් අයකර ගත යුතුව ඇත. මෙම නිලධාරිනියගෙන් මෙම මුදල අයකර ගැනීමට අදාළව මහනුවර දිසා අධිකරණයේ නඩු අංක 29052/එම්.ආර් යටතේ නඩුවක් පවත්වාගෙන ගොස් ඇත. වර්තමානයේ මුදලේ අගය අවප්‍රමාණය වීමත් සමග අදාළ නඩුව සක්‍රීයව පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවන බැවින් ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2022.10.17 දිනැතිව නීතිපති උපදෙස් ඉල්ලා ඇත.
	එකතුව					**රු.5,665,025.00**	

සෙසු සියළු නිලධාරීන් ලංකාවට පැමිණීමේදී මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස 2024.07.22 දිනැතිව ආගමන විගමන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. තවද දණ්ඩන මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස ඉහත සියලු නිලධාරීන් වෙත සිහිකැඳවීම් යොමු කර ඇත.

ඩී.පී. වික්‍රමසිංහ
ලේඛකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.